**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ සංගීත පීඨයට සිසුන් බඳවා ගැනීමේ අභියෝගතා පරීක්ෂණය**

උක්ත පරීක්ෂණයේ දී අපේක්ෂක අපේක්ෂිකාවන්ට ලකුණු ලැබෙනු ඇත්තේ පරීක්ෂණ මණ්ඩල 04 කින් දෙනු ලබන ලකුණුවල එකතුවක් හැටියටය. එක් එක් මණ්ඩලයේ පරීක්ෂකවරුන් විසින් තනි තනිව සිය ස්වාධීන ලකුණු ලැයිස්තුව බැගින් ලබාදිය යුතුය. ඒ සඳහා විශ්වවිද්‍යාල අභ්‍යන්තරයෙන් මෙන්ම බාහිර ප්‍රවීණයන්ගෙන්ද පරීක්ෂණ මණ්ඩල සමන්විත වේ. පරීක්ෂණ මණ්ඩලය සාමූහිකව කථා කොට ලකුණු ලබාදීම සපුරා තහනම් වේ. එසේ තනි තනිව ලකුණු දෙන පරීක්ෂකවරුන්ගේ සංඛ්‍යාව 20ක් හෝ ඊට වැඩිය. විනිවිධභාවය සහතික කිරීම, බලපෑම් කිරීමට ඇති අවකාශය ඉවත් කිරීම හා අපේක්ෂක අපේක්ෂිකාවන්ට ඉහළම සාධාරණයක් ඉෂ්ඨ කිරීම පිණිස මෙම ක්‍රමවේදය විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කරනු ලැබේ.

**(1) පළමු පරීක්ෂණය - ගායනය/ වාදනය (ප්‍රධාන විෂයය ඇගයීම)**

අ.පො.ස. උසස් පෙළ සංගීත විෂයේ දී ප්‍රධාන විෂය ලෙස හදාරණ ලද විෂය ඇසුරින් ශාස්ත්‍රීය ගායනය හෝ වාදනය, ජන ගායනා, සරල ගීත හෝ නාට්‍ය ගීත පිළිබඳ පොදු ප්‍රායෝගික දැනුම මෙහිදී පරීක්ෂාවට ලක් කෙරේ. නියම කරනු ලබන කාල වේලාව තුළ උක්ත ඉදිරිපත් කිරීම් තුනක් පරීක්ෂණ මණ්ඩලය ඉදිරිපිට අපේක්ෂකයා/අපේක්ෂිකාව විසින් ඉදිරිපත් කළ යුතුය. එක් එක් ගායන අභ්‍යාසයක් සඳහා මිනිත්තු 07 ක් බැගින් ගායන අංග 03 සඳහා උපරිම කාලය මිනිත්තු 20 කි.

**ඇගයීම**

| | | | |
|---|---|---|---|
| i | විවිධ ගායන/ වාදන ශෛලීන්ට අනුව නිවැරදි සෘති ස්වර පිළිබඳව දක්වන ශක්‍යතා | - | 15 |
| ii | ගායනයේ / වාදනයේ හඬ මාධූර්‍යය හා තාක්ෂණික නිරවද්‍යතාවය | - | 15 |
| iii | තාල අවබෝධය සහ භාවිතය පිළිබඳ ශක්‍යතාව | - | 10 |
| iv | ගායනයේ / වාදනයේ දක්වන භාව ප්‍රකාශන හා ප්‍රාසංගික ගුණය | - | 10 |
| | | | 50 |

**(2) දෙවන පරීක්ෂණය ගායනය/ වාදනය (අනු විෂයය ඇගයීම)**

අ.පො.ස. උසස් පෙළ සංගීත විෂයේ දී අනු විෂය ලෙස අපේක්ෂකයා/ අපේක්ෂිකාව විසින් හදාරණ ලද හෝ ප්‍රගුණ කර ඇති විෂයයේ කුසලතාවය මෙහිදී පරීක්ෂා කිරීමට ලක්කෙරේ. උපරිම කාලය මිනිත්තු 10යි.

**ඇගයීම**

| | | | |
|---|---|---|---|
| i | වාදනයේදී / ගායනයේ දී දක්වන නිවැරදි සෘති හා ස්වර භාවිතය පිළිබඳ ශක්‍යතාවය | - | 10 |
| ii | වාද්‍ය භාණ්ඩ නිවැරදිව හැසිරවීම/ කටහඬ, ඉරියව් හා තාක්ෂණික නිරවද්‍යතාවය | - | 10 |
| iii | තාල අවබෝධය සහ භාවිතය පිළිබඳ ශක්‍යතාව | - | 10 |
| | | | 30 |

**(3) තෙවන පරීක්ෂණය - වාචික**

**ඇගයීම**

i සමාජ සංස්කෘතික පරිසරය පිළිබඳ අපේක්ෂකයාගේ අවබෝධය විමසීම
ii සංගීතය පිළිබඳ අපේක්ෂකයාගේ ආකල්ප විමසීම
iii අපේක්ෂකයාගේ අභිලාෂ හා බලාපොරොත්තු විමසීම

ඉහත කරුණු මුල්කරගෙන සංගීතය පිළිබඳ සාමාන්‍ය දැනීම ඇගැයීම පිණිස අසනු ලබන කෙටි ප්‍රශ්න වලින් අපේක්ෂකයන් සතු අදහස් ප්‍රකාශ කිරීමේ කුසලතාවය නිරීක්ෂණය කරනු ලැබේ. වාචික පරීක්ෂණය සඳහා එක් අයෙකුට උපරිම කාලය මිනිත්තු 10 කි. ලබාදිය යුතු උපරිම ලකුණු ප්‍රමාණය 10 කි.

## (4) සිව්වන පරීක්ෂණය

කැඳවනු ලබන අපේක්ෂකයා/අපේක්ෂිකාව විසින් ඔවුන්ගේ කුසලතා ප්‍රදර්ශනය කිරීම සඳහා ඔවුන් විසින් දිනා ඇති විවිධ සහතික, පදක්කම් හා ප්‍රසංග සඳහා ලැබී ඇති ප්‍රශංසනාත්මක ලිපි සමග තමන් විසින් ඉදිරිපත් කර ඇති ප්‍රසංග වල ඡායාරූප 10 කින් යුත් ගොනුවක් (Portfolio) සම්මුඛ පරීක්ෂණය සඳහා රැගෙන ආ යුතුය.

දේශීය මට්ටමේ හැකියාවන් සඳහා ප්‍රථම ස්ථානයකට එක් ලකුණක් ද ඉතිරි ස්ථාන සඳහා දශමස්ථාන වලින් ලකුණු එකතු වන ආකාරයට ද ජාත්‍යන්තර මට්ටමේ දිනා ඇති පදක්කම් හෝ සහතිකපත් සඳහා ප්‍රථම ස්ථානයකට ලකුණු දෙකක් ද වශයෙන් අනෙකුත් ස්ථාන සඳහා දශමස්ථාන වලින් ලකුණු එකතු වන ආකාරයට උපරිම ලකුණු 10 ක් සිව්වන පරීක්ෂණයේ දී ප්‍රදානය කෙරේ.

උදාහරණ ලෙස, ලකුණු ලබාදීම සඳහා සළකා බලන ඉසව් පහත දක්වා ඇත.

**ජාතික තලය**

ජාතික සංගීත හා නැටුම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අවසාන සහතික පත්‍රය.
ගුවන්විදුලියේ ශාස්ත්‍රීය ශිල්පියෙකු ලෙස ඒ ශ්‍රේණියට අයත්වීම.

**ඒක පුද්ගල ඉදිරිපත් කිරීම් ජාතික තලය**
ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය, තෙවන ස්ථානය

**කණ්ඩායම් ලෙස ඉදිරිපත් කිරීම ජාතික තලය**
ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය, තෙවන ස්ථානය

**ජාත්‍යන්තර තලය**

**ඒකපුද්ගල ඉදිරිපත් කිරීම් ජාත්‍යන්තර තලය**
රන් පදක්කම/ප්‍රථම ස්ථානය, රිදී පදක්කම/ දෙවන ස්ථානය, ලෝකඩ පදක්කම/තෙවන ස්ථානය, සහභාගීත්වය

**කණ්ඩායම් මට්ටමින් ඉදිරිපත් කිරීම් ජාත්‍යන්තර තලය**
රන් පදක්කම/ප්‍රථම ස්ථානය, රිදී පදක්කම/ දෙවන ස්ථානය, ලෝකඩ පදක්කම/තෙවන ස්ථානය, සහභාගීත්වය

කුසලතා ඇගයීමේ දී අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටි වර්ෂයට පෙර වර්ෂ 3කට අදාළ සහ අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටි වර්ෂයට පසු වර්ෂයකට අදාළ කුසලතා සහතික පමණක් සළකා බලනු ලැබේ.

## (5) අභියෝග්‍යතා පරීක්ෂණයේ පරීක්ෂණ මණ්ඩල සංයුතිය

එක් එක් පරීක්ෂණ මණ්ඩල සඳහා වෙන වෙනම කණ්ඩායම් ඇතුළත් වේ. අංශප්‍රධාන හැර වෙනත් අයට මණ්ඩල දෙකක් නියෝජනය කළ නොහැකිය. පරීක්ෂණ මණ්ඩල 04 සඳහා එක් එක් අපේක්ෂකයා/අපේක්ෂිකාව එක් දිනක් තුළ මුහුණ දිය යුතුය.

එක් අපේක්ෂකයකුට පරීක්ෂණ මණ්ඩල 04 සඳහා දිනකට මුහුණ දීමට ගතවන කාලය අනුව දිනකට කැඳවන අපේක්ෂක/අපේක්ෂිකාවන් ප්‍රමාණය පීඨය විසින් තීරණය කළ යුතුය.

**පළමු පරීක්ෂණ මණ්ඩලය**

- i ගායන, වාදන ශෛලීන්ට අයත් අධ්‍යයනාංශ ප්‍රධානවරුන් හෝ අංශප්‍රධාන විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්ගෙන් ඉහළ ශ්‍රේණිවල හතර දෙනෙක් - 04
- ii බාහිර විෂය ප්‍රවීණයන් තිදෙනෙක් - 03

**දෙවන පරීක්ෂණ මණ්ඩලය**

- i ගායනය/ වාදන විෂය ක්ෂේත්‍ර වලට අදාළව පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් හෝ ඉන් ඉහළ ශ්‍රේණියේ සිව් දෙනෙක් - 04
- ii බාහිර විෂය ප්‍රවීණයන් තිදෙනෙක් - 03

**තෙවන පරීක්ෂණ මණ්ඩලය**

i පීඨ මණ්ඩලය නියෝජනය කරන බාහිර මහාචාර්යවරුන් හෝ එවැනි පිළිගත් දෙදෙනෙක් - 02

ii පීඨය නියෝජනය කරන පළමු දෙවන පරීක්ෂක මණ්ඩලවලට ඇතුලත් නොවන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් හෝ ඊට ඉහළ ශ්‍රේණිවල එක් අයෙක් - 01

**සිව්වන පරීක්ෂණ මණ්ඩලය (සහතික පරීක්ෂාව)**

ලේඛකාධිකාරී හෝ ඔහු විසින් නම් කරනු ලබන පරිපාලන නිලධාරීවරයෙකු, පීඨයේ සහකාර ලේඛකාධිකාරී හා අධ්‍යයන හා ශිෂ්‍ය සේවා අංශයේ සහකාර ලේඛකාධිකාරී හෝ නියෝජිතයකු

සම්පූර්ණ පරීක්ෂණ මණ්ඩල සාමාජිකත්වය 20කි. මෙම පරීක්ෂණ මණ්ඩලවලට ඒ ඒ පීඨයන් නියෝජනය කරන බාහිර මහාචාර්යවරුන් හෝ ඒ හා සමාන්තර විෂය ප්‍රවීණයන් ඇතුලත් විය යුතුය. පරීක්ෂක මණ්ඩල සංයුතිය සඳහා පීඨ මණ්ඩලයේ හා සනාතන සභාවේ අනුමැතිය ලබාගෙන තිබිය යුතුය. අපේක්ෂකයකු/අපේක්ෂිකාවක විසින් ඉහත දක්වා ඇති සියලු පරීක්ෂණ වලින් ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණයේ එකතුව ලකුණු 50 කි.

ඉහත නිර්ණායක සහ ක්‍රමවේදය 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සරත් චන්ද්‍රජීව**
**උපකුලපති**

පිටපත - පීඨාධිපති/සංගීත පීඨය
සහකාර ලේඛකාධිකාරී/සංගීත පීඨය